TF/AD/09/04
2026-08-19 දින.

**කුළී පදනම මත වායුසමනය කළ බස් රථයක් ලබා ගැනීම සඳහා මිළ ගණන් කැඳවීම.**

ටවර් හෝල් රඟහල පදනම මඟින් සංවිධානය කරන ටවර් ප්‍රභාස්වර ප්‍රසංගයක් 2026-09-18 දින ප.ව 6.00 ට මොනරාගල මහජන ක්‍රීඩාංගනයේදී පැවැත්වේ.

ඒ සඳහා කලාකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලය සහභාගී වීම සඳහා හා වාද්‍ය භාණ්ඩ හා වේදිකා පසුතල හා රංගවස්ත්‍ර බහාලු ගමන් මලු 03ක් පැටවිය හැකි ආසන 35කින් යුත් වායුසමනය කරන ලද බස්රථයක් කුළීපදනම මත එදිනට ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමට අවශ්‍යව ඇත. තවද 2026-09-18 දින පෙරවරු 5.00ට මරදාන ටවර් රඟහලින් ගමන් අරඹා කඩවත දක්ෂිණ අධිවේගී මාර්ගය ඔස්සේ මත්තල දක්වා ගමන් කර බුත්තල හරහා මොනරාගල දක්වා ගමන් කිරීමටත් ප්‍රසංගය අවසන් වී 2026.09.18 දින මධ්‍යම රාත්‍රී 12.00ට පමණ මොනරාගලින් පිටත් වී නැවත පෙර සඳහන් කළ මාර්ගය ඔස්සේ මරදාන ටවර් රඟහල දක්වා පැමිණීමට නියමිතය.

ඉහත සඳහන් පරිදි ප්‍රවාහන පහසුකම් සැපයිය හැකි වායුසමනය කළ බස් රථයකට අදාළ මිළ ගණන් වර්ෂ - 2026-09-08 දින පෙ.ව.10.30 ට පෙර ලැබෙන සේ **සභාපති,ප්‍රසම්පාදන කමිටුව, ටවර් හෝල් රඟහල පදනම, සව්සිරිපාය, අංක 123, විජේරාම මාවත, කොළඹ-07** ලිපිනයට අතින් ගෙනවිත් හෝ ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සලස්වන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මිළ ගණන් ලබාගැනීම අවසන් වූ සැනින් එම මිළ ගණන් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට ලංසුකරුට හෝ ලංසුකරුගේ බලයලත් අයෙකුට සහභාගි විය හැකිය. ප්‍රමාද වී ලැබෙන මිළ ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ **''කුළී පදනම මත බස්රථයක් ලබා ගැනීම සඳහා මිළ ගණන්''** ලෙස සඳහන් කරන මෙන් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

**නිපුණ දිසානායක**
**අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන)**
**දු.ක. : 0112682324**
**ෆැක්ස් අංකය : 0112678517**
**විද්‍යුත් තැපැල : towersl@sltnet.lk**